# 2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, උතුරු මැද පළාත.**

වැය ශීර්ෂ අංකය - 620

## අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

## 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. ආයතනය පිළිබඳ හැඳින්වීම

පළාත් කෘෂිකර්ම ,කෘෂි නිෂ්පාදන අලෙවි ,සත්ත්ව නිෂ්පාදන සහ සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් උතුර මැද පළාතේ කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු යන අංශයන්ගෙන් පළාත සංවර්ධනය කිරීම සඳහා බලධාරීත්වය දරණ රාජ්‍ය ආයතනය වේ. මෙම කර්තවයන් සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක කටයුතු කරනු ලබයි.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීම සඳහා විශාල කාර්ය භාර්යක් ඉටු කරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් කෘෂිකර්මික නිෂ්පාදන හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම , අලෙවිය හා තාක්ෂණික සංවර්ධනය, කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත වැඩි දියුණු කිරීම, කෘෂිකර්මය ආශ්‍රිත ආයතන වල කටයුතු ශක්තිමත් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සම්බන්ධ සංවර්ධන කටයුතු සිදු කරනු ලබන අතර, ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුල පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන හා ඵලදායිතාව මෙන්ම සත්ත්ව සෞඛ්‍ය සංවර්ධනය, ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම යන සංරචක ඔස්සේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

එමෙන්ම ධීවර විෂයට අදාල මෙහෙයුම් හා අධීක්ෂණ ක්‍රියාවලියද මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන කාර්යයක් වේ. සියළු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවලද සහයෝගය ලබා ගනිමින් පළාතේ කෘෂි, සත්ත්ව නිෂ්පාදන සහ ධීවර අංශ පුළුල් කර ප්‍රධාන වශයෙන් ස්වයං පෝෂිත ආර්ථිකයක් තුලින් ජන දිවිය ශක්තිමත් කිරීම අරමුණයි.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම** - "ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක්."

**මෙහෙවර** - "කෘෂිකර්ම, කෘෂි හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි. සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

අරමුණු


- ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් පළාත් ප්‍රතිපත්ති භාවිතා කරමින් වැඩසටහන් සැලසුම් කර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සම්ප්‍රදායන් රැකගනිමින් සහ නවීන තාක්ෂණයට අනුගත වෙමින් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පළාතේ 80 % ක් පමණ වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
- තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගත හැකි පරිදි කෘෂිකාර්මික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකර්ම, ධීවර හා සත්ව නිෂ්පාදන සියළු අංශ මගින් පළාත තුළ සංවර්ධනය ඇති කර ජාතික සංවර්ධනයට ද දායක වීම.
- මිරිදිය ධීවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් සපයන පළාත බවට පත්කිරීම.
- ධීවර කර්මාන්තයේ නියැලෙන පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුල නිම කිරීම.
- නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණය පිළිබඳ ව දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.
- වස විස නැති ආහාර පරිභෝජනයට යොමු වන පිරිස වර්ධනය කිරීම.
- සුළු පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය අනුබල සැපයීම තුලින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.
- කෘෂි නිෂ්පාදන අලෙවි සමිති මඟින් එම කටයුතු විධිමත් කිරීම.
- මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම.
- ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.
- අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම.

## 1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

- ආයතනයේ හා දෙපාර්තමේන්තු දෙකෙහි පරිපාලන කටයුතු සිදු කිරීම.
- පිරිස් පාලන කටයුතු සිදු කිරීම.
- මූල්‍ය පාලන කටයුතු.
- සංවර්ධන කටයුතු.
- අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය සහ කාර්යක්ෂම සේවාවක් සපයන ආයතනයක් බිහිකිරීම.
- ධීවර හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ප්‍රවර්ධනය.
- කෘෂි අශ්‍රිත නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැපයීම සඳහා නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.

1.4 සංවිධාන සටහන

<u>උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සංවිධාන සටහන</u>



## 1.5 සේවා ජාලය

1.5.1 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, දෙපාර්තමේන්තු වල ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

II. පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1.5.2 දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ, උප කාර්යාල, ව්‍යවස්ථාපිත ආයතන හා වෙනත් ආයතන හෝ සංවිධාන.

I. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

- නියෝජ්‍ය කෘෂිකර්ම ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය හා මහඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය.
- සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය 6ක් හා කෘෂිකර්ම උපදේශන කාර්යාලය - 32

II. පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, අනුරාධපුර.
- දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, පොළොන්නරුව.
- සත්ව ගොවිපළ, තිරප්පනේ.
- පශු වෛද්‍ය කාර්යාල -29

1.5.3 ව්‍යවස්ථාපිත ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

1.5.4 පළාත් පාලන ආයතන - යටතේ පවතින වෙනත් ආයතන හෝ සංවිධාන

- නැත

**1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේනතුව/ ව්‍යවස්ථාපිත ආයතනය/පළාත් පාලන ආයතනය සඳහා අරමුදල්ලැබෙන ප්‍රභවයන්**

- සාමූහික ප්‍රධාන - 22
- පළාත් සභා සංවර්ධන ප්‍රධාන - 23
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන - 24
- ලෝක බැංකු ආධාර - 33

**1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති. (තිබේ නම්)**

අ) ව්‍යාපෘතියේ නම - දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය.

ආ) දායක නියෝජිතායතනය - ලෝක බැංකු ආධාර හා ශ්‍රී ලංකා රජය.

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - ඇමරිකා ඩොලර් මිලියන 125.

ඈ) ව්‍යාපෘති කාල සීමාව - 2019 සිට 2024 දක්වා

## 02. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම.

සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් අත්කරගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යන අරමුණ කරා ලගාවීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ පහත සඳහන් අංශ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී කටයුතු කරන ලදි.

01. ධීවර කටයුතු ප්‍රවර්ධනය.
02. කෘෂි කටයුතු.
03. පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන්.

මේ සඳහා රු.මි. 89 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. ධීවර කටයුතු ප්‍රවර්ධනය, මිරිදිය ධිවර කටයුතු හා විසිතුරු මත්ස්‍ය වගාව යන අංශ යටතේ ප්‍රතිපාදන වෙන්කරන ලදි. ධීවර ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම හා වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් ධිවර කර්මාන්තයේ යෙදෙන ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ සඳහා නොමිලේ මත්ස්‍ය ඇගිල්ලන් බහාලීම, ධීවර සමිති සඳහා අලෙවි කුටි ලබාදීම ,සහනාධාර පදනම මත ධීවර ආම්පන්න ලබාදීම, ධීවර ප්‍රජාව සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම හා පදවිය, ගල්කුලම මත්ස්‍ය .අභිජනන මධ්‍යස්ථාන නවීකරණය හා සංවර්ධනය යන කාර්යයන් ක්‍රියාත්මක කරන ලදි .


- **මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය**

වාර්ෂිකව නිෂ්පාදනය වන මත්ස්‍ය අස්වැන්න වැඩිවීම මෙහි මූලික අරමුණ වන අතර, ධීවර ජනතාවගේ ආදායම ඉහළයාම මෙන්ම මත්ස්‍ය පරිභෝජනය ද මෙමගින් වැඩි වේ. ඒ අනුව මන්ද පෝෂණ අඩු කිරීම හා යහපත් පෝෂණ තත්වයක් ලගාකරදීම යන පරමාර්ථයෙන් මත්ස්‍ය පැටවු 4,616,471 ක් ජලාශ සඳහා බහාලීම සිදුකරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 23 ක ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ වැව් 71 ක් සඳහා ප්‍රතිලාභීන් 5,000 ක් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී .

**මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය - (මෙ.ටො.)**

| දිස්ත්‍රික්කය | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| අනුරාධපුර | 17,840 | 21,855 | 19,324 |
| පොළොන්නරුව | 9,960 | 9,505 | 8,684 |
| **එකතුව** | **27,800** | **31,360** | **28,010** |

**මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො.)**




(මූලාශ්‍ර - ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය)


- **විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය.**

තවද ධීවර කටයුතු ප්‍රවර්ධනය යටතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තය නගා සිටුවීම සඳහා විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා උපකරණ ලබාදීම 50% දායකත්වය මත ,(සිමෙන්ති ටැංකි ලබාදීම හා විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදි). මෙහිදී වෙළඳ පොළට සුදුසු ආකාරයේ විසිතුරු මසුන් නිෂ්පාදනය වැඩිවීම, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම, විදේශ විනිමය ඉපයීම යන අරමුණින් මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

**විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය - මිලියන (මත්ස්‍ය)**

| දිස්ත්‍රික්කය | **2019** | **2020** | **2021** |
|---|---|---|---|
| අනුරාධපුර | 6 | 6.6 | 7.39 |
| පොළොන්නරුව | 10 | 11 | 12.32 |
| එකතුව | 16 | 17.6 | 19.71 |

**විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය - මිලියන (මත්ස්‍ය)**




(මූලාශ්‍ර - පළාත් සහා සමීක්ෂණ)

- **කෘෂි කටයුතු.**

වර්ෂය පුරා වගා කටයුතු සඳහා ජලය ලබාදීම හා වර්ෂය පුරා අස්වනු නෙලා ගැනීමට හැකිවීම මගින් ගොවි ජනතාවගේ ආදායම් ඉහළයාම මගින් ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගෙන 2021 වර්ෂයේ කෘෂි වගා ළිං සංවර්ධනය කිරීම සිදුකර න ලදි. මෙහිදි 50% දායකත්වය මත පළාත තුල ගොවීන් 94ක් සඳහා වගා ළිං ඉදිකිරිමට මූල්‍ය ආධාර ලබාදෙන ලදි.

මේ අනුව ධිවර කටයුතු ප්‍රවර්ධනය හා කෘෂි කටයුතු අංශ සඳහා රු.මි. 83.9 ක මුදලක් 2021වර්ෂය තුල වියදම් දරණ ලදි.

2021 වර්ෂයේ ව්‍යාපෘති සියල්ලම සාර්ථකව නිමකිරීමට හැකි වූ අතර ,සියළු සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 100% කි. ඒ අනුව 2021 වර්ෂයේ ඉලක්කයන් අභියෝගවලින් තොරව සාර්ථකව සපුරාගැනීමට හැකි විය.

### 2022 වර්ෂයේ ලඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක.

1. සහනාධාර පදනම මත ධිවර කාර්මිකයින් 20 ක් සඳහා ධීවර ආම්පන්න ලබාදීම.
2. ධීවර කාර්මිකයින් 200 ක් සදහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
3. පදවිය, ගල්කුලම මත්ස්‍ය. අභිජනන මධ්‍යස්ථානය නවීකරණය හා සංවර්ධනය.
4. සහනාධාර පදනම මත විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 100 ක් සඳහා උපකරණ / ද්‍රව්‍ය ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය.
5. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් 300 ක් සදහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
6. අභිජනන මධ්‍යස්ථාන 5 ක් සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදීම.
7. විසිතුරු මත්ස්‍ය අලෙවි මධ්‍යස්ථානයක් ඇති කිරීම.

2022 වර්ෂයේ ඉහත සඳහන් කරන ලද ඉලක්ක ලගා කර ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කරන අතර ඒ සඳහා සියලු සම්පත් නිසි ලෙස උපයෝජනය කරමින් ඉහල ප්‍රගතියක් කරා ලගා වීම අපේක්ෂාවයි.

ජේ.එම්.ආර්.පී. ජයසිංහ.
ලේකම් ,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා
සත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

**03. පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**එන්සීපී-පීටී**
**(එෆ්)**

<u>**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය**</u>

<u>**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**</u>

<u>**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**</u>

රු.

| අයවැය 2021 | | සටහන (එන්සීපී -පීටීර් 3 ටඅනුව) | තතය 2021 | 2020 | එන්සී පී- පීටී/ස ටහන් |
|---|---|---|---|---|---|
| | <u>ආදායම් ලැබීම්</u> | | | | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1 | - | | ආර්1 |
| - | බදු නොවන ආදායම | 2 | - | | |
| **-** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **-** | - | |
| | <u>ආදායම් නොවන ලැබීම්</u> | | | | |
| 1,213,110,738 | භාණ්ඩාගාර අග්‍රිම | | 380,025,000 | 133,050,000 | ඕ1 |
| - | තැන්පතු | | 22,764,860 | 695,966 | ඕ1 |
| 1,200,000 | අත්තිකාරම් ලැබීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 2,879,885 | 37,753,396 | ඕ1 |
| - | අත්තිකාරම් ලැබීම් - අනුදත් අත්තාකාරම් | | - | - | ඕ2 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර ලැබීම් | | - | - | ඕ3 |
| **1,214,310,738** | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **405,669,745** | **171,499,362** | |
| **1,214,310,738** | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **405,669,745** | **171,499,362** | |
| - | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 56,096,462 | - | |
| **1,214,310,738** | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **349,573,283** | **171,499,362** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | <u>**පුනරාවර්තන වියදම්**</u> | | | | |
| 28,752,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 3 | 27,658,362 | 27,547,696 | ඊ3 |
| 6,050,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 4 | 5,751,990 | 5,164,490 | |
| 350,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 5 | 192,971 | 390,044 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **35,152,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **33,603,323** | **33,102,230** | |
| | <u>මූලධන වියදම්</u> | | | | |
| 1,258,738 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | **6** | 1,225,865 | - | ඊ3 |
| 900,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **7** | 899,770 | 2,409,282 | |
| 1,173,500,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **8** | 294,864,231 | 75,719,131 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් - වෙනත් දෙපාර්තමේන්තු විසින් කළ වියදම් | | 1,591,969 | 250,000 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **9** | - | - | ඊ3 |
| - | හැකියා වර්ධනය | **10** | - | - | |
| - | වෙනත් මූලධන වියදම් | **11** | - | - | |
| **1,175,658,738** | **මුළු මූලධන වියදම් (උ)** | | **298,581,835** | **78,378,413** | |
| - | තැන්පතු ගෙවීම් | | 23,852,161 | 3,897,996 | **ජී-2** |
| 3,500,000 | අත්තිකාරම් ලැබීම් - පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් | | 1,960,310 | 4,232,042 | **ජී-3** |
| - | අත්තිකාරම් ලැබීම් - අනුදත් අත්තාකාරම් | | - | - | **ජී-3** |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| **3,500,000** | **ප්‍රධාන ලෙජර් වියදම් එකතුව (ඌ)** | | **25,812,471** | **8,130,038** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **357,997,629** | **119,610,681** | |
| **1,214,310,738** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(8,424,346)** | **51,888,681** | |
| - | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ගැලපුම් ශේෂය** | | (9,497,194) | (157,685) | **ජී-5** |
| - | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 1,072,848 | 1,230,533 | **ජී-1** |
| | | | **(8,424,346)** | **1,072,848** | |

**3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

**එන්සීපී-පීටී (පී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යංශය,උතුරු මැද පළාත.**
**2021 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | එන්සීපී-පීටීජී(4) | 121,768,221 | 113,411,551 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | එන්සීපී-පීටීජී(3) | 7,803,674 | 8,723,250 |
| මුදල් හා මුදල් සමාන දෑ | එන්සීපී-පීටීජී(1) | 1,072,848 | 1,072,848 |
| **මුළු වත්කම්** | | **130,644,743** | **123,207,649** |
| **ශුද්ධ වත්කම් /ස්කන්ධය** | | | |
| පළාත් භාණ්ඩාගාර(යට/යෙන්) පියවිය යුතු/ ලැබිය යුතු ශුද්ධ වත්කම | | 6,036,813 | 5,869,088 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 121,768,221 | 113,411,551 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | එන්සීපී-පීටීජී(2) | 1,766,861 | 2,854,162 |
| අග්‍රිම ශේෂය | එන්සීපී-පීටීජී(1) | 1,072,848 | 1,072,848 |
| **මුළු වගකීම්** | | **130,644,743** | **123,207,649** |

පිටු අංක 05 සිට 71 දක්වා එන්සීපී-පීටීආර්(1) සිටඑන්සීපී-පීටීජී(6) දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක සිට දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.එබැවින් ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමි.

| | | |
|---|---|---|
| …………………….......... | ……………….......... | ………………………………….. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධානමූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | |
| තනතුර : | තනතුර : | නම : |
| දිනය : | දිනය : | දිනය : |

### 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**එන්සීපී-පීටී**
**(සී)**

**පළාත් කෘෂිකර්ම,කෘෂි නිෂ්පාදන අළෙවි,සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය,උතුරු මැද පළාත.**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2021 | 2020 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | රු. | රු. |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 1,202,780 | 1,225,294 |
| වෙනත් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 5,413,196 | 1,386,370 |
| අග්‍රිම ලැබීම් | 380,025,000 | 133,050,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් / පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 2,901,986 | - |
| අත්තිකාරම් අයකර ගැනීම් - අනුදත් අත්තාකාරම් | - | - |
| තැම්පතු ලැබීම් | 22,764,860 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **412,307,822** | **135,661,664** |
| | | |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් | 33,410,352 | 32,712,186 |
| සහනාධාර සහ මාරු කිරීම් | 192,971 | 390,044 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 56,096,462 | 21,439,063 |
| අත්තිකාරම් ගෙවීම් / පළාත් රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 1,721,710 | - |
| අත්තිකාරම් ගෙවීම් - අනුදත් අත්තාකාරම් | - | - |
| තැම්පතු ගෙවීම් | 23,852,161 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **115,273,656** | **54,541,293** |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | **297,034,166** | **81,120,371** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| | | |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |

| | | |
|---|---|---|
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 296,989,866 | 78,128,413 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් වියදම් | 44,300 | - |
| වර්ෂය තුල ආයෝජනවල යෙදවුම් - මුදලින් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **297,034,166** | **78,128,413** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)= (ඇ)-(ඉ)** | (297,034,166) | (78,128,413) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | 2,991,958 |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශ ණය ගැනීම් | - | - |
| ප්‍රධානයන් ලැබීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලින් ලැබීම් | - | 4,528,495 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **4,528,495** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු, වෙනත් වගකීම්, මුදල් හැර ජංගම වත්කම් වලට ගෙවීම් | - | 7,678,138 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **7,678,138** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **(3,149,643)** |
| **මුදල් වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **(0)** | **(157,685)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **1,072,848** | **1,230,533** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **1,072,848** | **1,072,848** |

## 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය. (අදාල නොවේ)

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසාන ඇස්තමේන්තුව | | |
| - | - | - | - | - | - |

### 3.6 ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය.

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කරනු ලැබූ ප්‍රතිපාදනය වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 34,902,000 | 35,152,000 | 33,603,323 | 95.59% |
| **මූලධන** | 91,000,000 | 1,175,658,738 | 298,581,835 | 25.39% |

| වැඩසටහන් නාමය * | පුනරාවර්තන | | | මූලධන | | |
|---|---|---|---|---|---|---|
| | 2021 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | 2021 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම |
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | |
| පළාත් සභා පරිපාලනය | 34,902,000 | 35,152,000 | 33,603,323 | | | |
| කෘෂිකර්ම සංවර්ධනය | | | | 91,000,000 | 1,175,658,738 | 298,581,835 |
| | | | | | | |

*වාර්ෂික මුදල් ප්‍රකාශයේ පිටු අංක **XIV** හි වර්ගීකරණය අනුව.

**3.7 ප.මු.රී 140 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.**

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කර ගන්නා ලද ප්‍රතිපාදන, වෙන් කර දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | ආණ්ඩුකාරවර කාර්යාලය | ධීවර ජනතාවට සහන සැලසීම මගින් ආර්ථිකයට දක්වන දායකත්වය ඉහල නැංවීම. | 50,000 | 50,000 | 44,300 | 88.6% |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.**

| වත් කම් කේත ය | කේත විස්තරය | 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා වැය විෂයට ගිණුම්ගතවූ ශේෂය | 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුලත් කල ශේෂය | 2021.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත උවද වත්කමක් ලෙස වාර්තා නොවූ ශේෂය(වත්කම් කළ.මෘදුකාංගයට ඇතුලත් නොවූ වටිනාකම) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම වත්කම් කළ. මෘදු.හරහා වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 2101 | වාහන | - | - | - | - |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 759,910 | 760,460 | 5,700 | 100% |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 139,860 | 139,860 | - | 100% |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | - | - | - |
| 2105 | ඉඩම් අත්පත් කර ගැනීම | - | - | - | - |
| 2106 | වෙනත් මූලධන වත්කම් | - | - | - | - |
| 2107 | යටිතල පහසුකම් වත්කම් | | - | - | |
| 2108 | කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම | - | - | - | - |
| 2109 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |

* 2102 වැය විෂයේ මෙම වර්ෂයට අදාල වියදම රු.759,910 හා වත්කම් කළමනාකරණ පද්ධතියේ ඇතුලත් වටිනාකම රු.760,460 අතර වෙනසක් පවතින අතර එම වෙනසට හේතු වනුයේ, රු. 6250 ක මුදලකට මිලදී ගත් ගෑස් සිලින්ඩරයක් පැවති ගෑස් වල ප්‍රමිතියෙන් තොර භාවය මත නැවත මිලදී ගත් ආයතනය වෙත ලබා දීමට කටයුතු කිරීම නිසා එය වැය විෂයෙන් ඉවත් කල නමුත්, වත්කම් කළමනාකරණ පද්ධතිය තුල ඇතුලත්ව පවතී. (එය ඉවත් කිරීමට අදාල අංශයන්ගෙන් ඉල්ලීම් කර ඇත) තවද, 2021 වර්ෂයේ මිලදී ගත් පරිගණක උපාංග අතර ඇතුලත් පරිගණක මූසික (Mouse) 6ක් (රු.5700) වර්ෂයේ වියදම තුල ඇතුලත් වුවත් එය වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීමට පහසුකම් සපයා නොමැති නිසා වත්කම් කළමනාකරණ පද්ධතියට ඇතුලත්ව නොමැත.

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

- 2022.04.30 දින වන විට අවසන් විගණන වාර්තාව විගණන කාර්යාලය විසින් නිකුත් කර නොමැත.

## 04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

**ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| අනු අංකය | ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| 1 | මහජන පැමිණිලි | 100% | | |
| 2 | ආයතනයේ කාර්යක්ෂමතාව | 100% | | |
| 3 | මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික කාර්ය මණ්ඩල වාර්තා ඉදිරිපත් කිරීම. | 100% | | |
| 4 | විගණන විමසුම් හා ඊට යවන පිළිතුරු. | 100% | | |
| 5 | ගිණුම් කටයුතු | 100% | | |
| 6 | යාවත්කාලීන කරන ලද හා නඩත්තු කළ ලිපිගොනු සහ ලේඛන වල මාසික ප්‍රගතිය | 100% | | |
| 7 | ධිවර අම්පන්න ලබාගත් ධීවරයින් සංඛ්‍යාව | 100% | | |
| 8 | ලබාදුන් අලෙවි කුටි සංඛ්‍යාව | 100% | | |
| 9 | ජලාශ සඳහා මුදා හරින ලද මත්ස්‍ය පැටවු සංඛ්‍යාව<br>මත්ස්‍ය පැටව් මුදා හරින ලද වැව් සංඛ්‍යාව | 100% | | |
| 10 | සාර්ථකව පුහුණුව සම්පූර්ණ කරන ලද ධීවර කාර්මිකයින් හා හා විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් සංඛ්‍යාව | 100% | | |
| 11 | සංවර්ධනය කරන ලද අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව | 100% | | |
| 12 | උපකරණ ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 100% | | |
| 13 | වට ආවරණ ලබාගත් විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සංඛ්‍යාව | 100% | | |
| 14 | සිමෙන්ති ටැංකි ඉදිකරන ලද විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සංඛ්‍යාව | 100% | | |
| 15 | වගා ළිං ඉදිකරණ ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව<br>අලුතින් වගාකරන ලද ඉඩම් අක්කර ප්‍රමාණය | 100% | | |

අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැදින්වීමක්,

1. අතින් රැගෙන එන ලද මහජන පැමිණිලි, අදහස් හා යෝජනා අමාත්‍යාංශය ඉදිරිපස තබා ඇති තැපැල් පෙට්ටියට බැහැලීමේ හැකියාව ඇත. ඒ පිළිබඳව කටයුතු කිරීම.
2. ආයතනයේ කාර්යක්ෂමතාව සඳහා කාර්ය මණ්ඩල වාර්තා අදාළ කාලසීමා තුළ යොමු කිරීම
3. ගිණුම් කටයුතු හා ලිපි ගොනු කටයුතු එදිනෙදා යාවත්කාලීන කිරීම. ( කාර්තු හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම).
4. නිවැරදි කලට විගණන විමසුම් වාර්තා යාවත්කාලීන කර ඉදිරිපත් කිරීම.
5. 2021 වර්ෂයේ ධීවර කටයුතු ප්‍රවර්ධනය හා කෘෂි කටයුතු යන අංශ යටතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා රු.මි 89 .ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. ධීවර කටයුතු ප්‍රවර්ධනය මිරිදිය ධිවර කටයුතු හා විසිතුරු මත්ස්‍ය වගාව යන අංශ යටතේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

ධීවර ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම හා වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 23 ක ධිවර කර්මාන්තයේ යෙදෙන ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ 71 ක් සඳහා මත්ස්‍ය පැටව් 4,616,471 ක් නොමිලේ මුදා හැර ඇත. , ධීවර සමිති සඳහා අලෙවි කුටි 10 ක් ලබාදීම ,සහනාධාර පදනම මත ධීවර කාර්මිකයින් 129 ක් සඳහා ධීවර ආම්පන්න ලබාදීම හා ධිවර කාර්මිකයින්ගේ දැණුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම සඳහා ධීවර කාර්මිකයින් 280 ක් හා විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් 780 ක් පුහුණුකර ඇත. පදවිය, ගල්කුලම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන නවීකරණය හා සංවර්ධනය යන කාර්යයන් ක්‍රියාත්මක කරන ලදි .

වාර්ෂිකව නිෂ්පාදනය වන මත්ස්‍ය අස්වැන්න වැඩිවීම මූලික අරමුණ වන අතර, ධීවර ජනතාවගේ ආදායම ඉහළයාම මෙන්ම මත්ස්‍ය පරිභෝජනය ද වැඩි වේ. ඒ අනුව මන්ද පෝෂණ අඩුකිරීම හා යහපත් පෝෂණ තත්වයක් ලගාකර දීම යන පරමාර්ථයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 23 ක ප්‍රතිලාභින් 5,000 ක් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘති සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී .

විසිතුරු මත්ස්‍ය කර්මාන්තය නගා සිටුවීම සඳහා 2021 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. අපනයන වෙළඳ පොලට සුදුසු ආකාරයේ විසිතුරු මසුන් නිෂ්පාදනය වැඩි කිරිම, විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරිම, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරිම හා විදේශ විනිමය ඉපයීම වැඩැ කිරිමේ අරමුණින් විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකියින් 433 ක් සඳහා උපකරණ ලබා දීම, ව්‍යවසායකයින් 168 ක් සඳහා වට ආවරණ ලබා දීම හා 226 දෙනෙකු සඳහා සිමෙන්ති ටැංකි ලබා දීම සිදු කරන ලදි.

වර්ෂය පුරා වගා කටයුතු සඳහා ජලය ලබාදීම හා වර්ෂය පුරා අස්වනු නෙලා ගැනීමට හැකිවීම මගින් ගොවි ජනතාවගේ ආදායම් මට්ටම ඉහල යාම මගින් ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහල නැංවීම අරමුණු කර ගෙන 2021 වර්ෂයේ කෘෂි වගා ළිං සංවර්ධනය කිරිම සිදු කරන ලදි. මෙහිදී 50% දායකත්වය මත පළාත තුල ගොවීන් 94 ක් සඳහා පගා ළිං ඉදිකිරිමට මූල්‍ය ආධාර ලබා දෙන ලදි.

## 05.පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හදුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

හදුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම්කල ඉලක්කය | එම ඉලක්කය ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාව ය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | ධීවර කාර්මිකයින් 129 ක් සඳහා ධීවර ආම්පන්න ලබාදීම | ධීවර කාර්මිකයින් සඳහා පහසුකම් සැපයීම | සහනාධාර පදනම මත ධීවර ආම්පන්න ලබාදීම | | | 100% |
| | අලෙවි කුටි 10 ක් ලබාදීම | ගුණාත්මක භාවයෙන් යුතු මත්ස්‍ය පාරිභෝජනය ඉහළ නැංවීම | ධීවර සමිති සඳහා අලෙවි කුටි ලබාදීම | | | 100% |
| | ජලාශ 71 ක් සඳහා මත්ස්‍ය පැටව් මුදා හැරීම | වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම | ග්‍රාමීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ජලාශ සඳහා මත්ස්‍ය පැටවු මුදා හැරීම | | | 100% |
| | ධීවර කාර්මිකයින් 280 ක් පුහුණු කිරීම | ධීවර කාර්මිකයින්ගේ දැණුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම | ධීවර ප්‍රජාව සඳහා පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | | | 100% |
| | අභිජනන මධ්‍යස්ථාන 1 ක් සංවර්ධනය කිරීම | මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය ඉහළ නැංවීම | පදවිය, ගල්කුලම මත්ස්‍ය. අභිජනන මධ්‍යස්ථාන නවීකරණය හා සංවර්ධනය කිරීම | | | 100% |
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් 433 ක් සඳහා උපකරණ ලබාදීම | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම | සහනාධාර පදනම මත විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය | | | 100% |
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් 168 ක් සඳහා වට ආවරණ ලබාදීම | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් සඳහා පහසුකම් සැපයීම | විසිතුරු මත්ස්‍ය වගා බිම් සඳහා වට ආවරණ ලබාදීම | | | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් 226 ක් සඳහා සිමෙන්ති ටැංකි ලබාදීම | ගුණාත්මක විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා සිමෙන්ති ටැංකි ලබාදීම | | | 100% |
| | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් 780 ක් පුහුණු කිරීම | විසිතුරු මත්ස්‍ය ව්‍යවසායකයින් ගේ දැණුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම | විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | | | 100% |
| | වගා ළිං 94 ක් ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම | වගා කටයුතු සඳහා වර්ෂය පුරා අඛණ්ඩව ජලය සැපයීම | කෘෂි වගා ළිං සංවර්ධනය කිරීම | | | 100% |

### 5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.

තිරසර සංවර්ධන අරමුණක් වන සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම අප අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන අරමුණක් ලෙස තෝරා ගෙන ඇත. මෙම අරමුණ කරා ලගා වීමේදී ඉහත ආකෘතියෙහි දක්වා අයුරින් විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ඉලක්ක, සැලසුම් හා කාර්යයන් මගින් 100% ක ප්‍රගතියක් එම සියලු ක්ෂේත්‍ර හරහා ලගා කර ගැනීමට අප අමාත්‍යාංශයට හැකිවිය.

2021 වර්ෂයේ ව්‍යාපෘති සියල්ලම සාර්ථකව නිමකිරීමට හැකි වූ අතර ,සියළු සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 100% කි. ඒ අනුව 2021 වර්ෂයේ ඉලක්කයන් අභියෝගවලින් තොරව සාර්ථකව සපුරාගැනීමට හැකි විය.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 4 | 3 | 1 |
| තෘතියික | 1 | 1 | - |
| ද්විතියික | 55 | 28 | 27 |
| ප්‍රාථමික | 13 | 8 | 5 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඉහත දක්වා ඇති දත්ත අනුව අමාත්‍යාංශය තුළ ජ්‍යෙෂ්ඨ, ද්විතික හා ප්‍රාථමික කාර්ය මණ්ඩල වල හිඟයක් පෙන්නුම් කරනු ඇත. මෙම හිඟය ආයතනයේ කාර්ය සාධනය උදෙසා පහත පරිදි බලපානු ඇත.

- ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
  අමාත්‍යාංශයේ සහකාර ලේකම් (පාලන) නිළධරයෙකුගේ පුරප්පාඩුවක් පවතී. මෙම පුරප්පාඩුව හේතුවෙන් ආයතනයේ පරිපාලන කටයුතු අපහසු වීම, සංවර්ධන කටයුතු මෙහෙයවීමේදී අවශ්‍ය දැනුම හා හැකියාව නොලැබීම නිසා ඉලක්ක හා අරමුණු ලගාකර ගැනීමේදී අපහසුතාවයන් වලට මුහුණ දීමට සිදු වීම හා දෙපාර්තමේන්තු දෙකෙහි සංවර්ධන කටයුතු පිළිබදව අමාත්‍යාංශ මගින් සිදු කරන අධීක්ෂණ ක්‍රියාවලිය අපහසුවීම වැනි ගැටලු වලට මුහුණ දීමට සිදු වී ඇත.

- ද්විතීයික කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
  ද්විතික කාර්ය මණ්ඩලයට අයත් කළමනාකරණ සේවා නිළධාරීන්ගේ පුරප්පාඩු හේතුවෙන් ආයතනික කටයුතු ඵලදායි අයුරින් සිදු කිරිම ගැටලුවක් වී ඇත තවද, සංවර්ධන නිළධාරී පුරප්පාඩු හේතුවෙන් සංවර්ධන කටයුතු මෙහෙයවීම, ක්ෂේත්‍ර අධීක්ෂණය, ප්‍රතිලාභීන් හා ආයතනය අතර සම්බන්ධීකරණ ක්‍රියාවලියට බාධා ඇති වීම වැනි ගැටලු වලට මුහුණ දීමට සිදු වී ඇත.

- ප්‍රාථමික කාර්යය මණ්ඩලයේ රියදුරු, කාර්යාල කාර්යය සහායක ප්‍රමාණවත් නොවීම.

  රියදුරු - ක්ෂේත්‍ර හා කාර්යාල කටයුතු සඳහා වාහන යෙදවීමේදී ප්‍රමාණවත් අයුරින් රියදුරන් නොමැති හෙයින් ඉලක්ක හා අරමුණු කෙරෙහි ළඟා වීමට බාධා ඇතිවීම.

  කාර්යාල කාර්යය සහායක - කාර්යාලය තුළ එදිනෙදා සිදු කරන කටයුතු වලදී එම කටයුතු කාර්යක්ෂම හා ඵලදායී අයුරින් පවත්වානෙ යාම සඳහා කාර්යාල කාර්යය සහායින් ප්‍රමාණවත් නොවීම මත ගැටලු ඇතිවීම.

**6.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව(දින/ මාස/ අවු.) | සමස්ත ආයෝජනය (Rs’000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| වාර්ෂික පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ මොඩියුල සකස් කිරීම. | 05 | දින 01 | | | දේශීය | යෝජිත පුහුණු සැලැස්ම තම කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර ආයතනයේ පුහුණු අවශ්‍යතාව සපුරාලීම. |
| අන්තර්ජාලගත පුහුණු කළමනාකරණ පද්ධතිය | 01 | දින 01 | | | දේශීය | අන්තර්ජාල භාවිතය ක්‍රමවත්ව කිරීමට අවශ්‍ය දැනුම. |
| තිරසාර ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම පිළිබඳ වැඩසටහන | 06 | දින 07 | | | දේශීය | තිරසාර සංවර්ධන අරමුණු ආයතනයට අදාළ කර ගනිමින් රටෙහි ආර්ථික ක්‍රියාවලියට දායකත්වයක් ලබා දීම උදෙසා කටයුතු කිරීමට අවශය දැනුම |
| දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන ඉඩම් කලමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින 02 | | | දේශීය | ඉඩම් කළමනාකරණය කිරීම පිළිබඳ දැනුම. |
| දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන පුහුණු පාඨමාලාව | 01 | දින 03 | | | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම මගින් ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව සිදු කිරිම. |
| භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 02 | | | දේශීය | භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය මගින් නිසි වේලාවන්ට භාණ්ඩ සමීක්ෂණ කටයුතු කිරීමට අවශ්‍ය දැනුම. |
| පරිගණක මෘදුකාංග හා දෘඩාංග පුහුණු වැඩසටහන | 01 | දින 02 | | | දේශීය | පරිගණක මෘදුකාංග හා දෘඩාංග පිළිබද විදිමත් පුහුණුවක් හා ඒ පිළිබද අවශ්‍ය දැනුම ලබා ගැනීම තුළින් ආයතනයේ කටයුතු ඵලදායී ලෙස ඉටු කිරිම. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නවක කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වන ප්‍රාරම්භක පුහුණු වැඩසටහන | 02 | දින 03 | | | දේශීය | නවක නිළධාරියෙකු ලෙස රාජ්‍ය ආයතනයක් තුළ රාජකාරි කිරීමේ දැනුම හා අවබෝධය ලබා ගැනීම. |
| වාහන පාලනය හා නඩත්තුව පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | දින 02 | | | දේශීය | වාහන නඩතුතු සම්බන්ධ කටයුතු හා වාහන සම්බන්ධ ලිපි ගොනු නිවැරදිව පවත්වා ගෙන යාම. |
| උතුරු මැද පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ ප්‍රායෝගික පුහුණු වැඩමුළුව | 01 | දින 01 | | | දේශීය | නිල වෙබ් අඩවිය වඩාත් සුරක්ෂිතව යාවත්කාලීනව පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම. |
| මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම | 01 | දින 03 | | | දේශීය | විධිමත් ආකාරයෙන් මූලික විමර්ශන හා විනය පරීක්ෂණ කටයුතු සිදු කිරීමේ දැනුම. |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වූයේ කෙසේදෙ? යන්න කෙටියන් පැහැදිලිකරන්න.

- මෙම පුහුණු වැඩසටහන් මඟින් ආයතනයේ මෙහෙයුම් කටයුතු නිවැරදි අයුරින් පවත්වාගෙන යාමට මෙන්ම, ආයතනයේ අරමුණු හා ඉලක්ක වෙත ලඟා වීමේදී පුහුණු වැඩසටහන් මගින් නිලධාරීන් ලබා ගන්නා දැනුම හැකියාවන් උපයෝජනය කරමින් එම අරමුණු හා ඉලක්ක සාර්ථකව සපුරාගත හැකි ය. එමෙන් ම කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම තුළින් අන්‍යොන්‍යනය අවබෝධය සහ සහෝදරත්වය ද වර්ධනය වේ.
- ඒ ඒ පුහුණුවීම් තුළින් අදාල නිලධාරීන්ගේ න්‍යාත්මක දැනුම වර්ධනය කිරීම තුලින් ආයතනය තුල අවශ්‍ය දැනුම වර්ධනය සඳහා පහසු වේ. එමඟින් ඵලදායි සේවයක් මහජනතාවට ලබා දීමට ඇති හැකියාව වර්ධනය වේ.
- නිලධරයන්ගේ දැනුම, ආකල්ප වර්ධනයෙන් ආයතනය තුළින් රටට අපේක්ෂා කරන දායකත්වය ඉහල මට්ටමක පවත්වා ගැනීමට මෙම පුහුණු වැඩසටහන් මහත් පිටුවහලකි.
- විවිධ ක්ෂේත්‍ර ආවරණය වන අයුරින් නිලධරයන් විවිධ පුහුණු වැඩසටහන් වලට ඉදිරිපත් කිරිම තුළින් ඔවුන්ට ආයතනයේ සියලු රාජකාරී කටයුතු පිලිබද දැනුම ලබා ගැනීමට හැකියාව පවතිනවා මෙන්ම ඔවුන්ට ඕනෑම ස්ථානයක ඕනෑම රාජකාරී කටයුත්තක් කිරිමට සුදුසු පුද්ගලයෙකු බවට පත් කිරිම මෙම පුහුණු වැඩසටහන් මගින් සිදු වන ප්‍රධානම කර්තව්‍යකි.

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදළ කර ගතයුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ. | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම. | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්. (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම්. | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම්. | - | - | - |
| 1.6 | වෙනත් ගිණුම්. | - | - | - |
| | | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රී 321)** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.3 | විගණනවිමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.(ප.ස 37 පෝරමය) | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (ප.මු.රී 83)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදි බලතල පවරාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| | | අනුකූල වේ | - | - |
| | | | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **6** | <u>අභයන්තර විගණනය</u> | | - | - |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | - | - |
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **7** | <u>විගණන හා කළමණාකරණ කමිටු</u> | | | |
| 7.1 | DMA චක්‍රෙල්ඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| 8 | <u>වත්කම් කළමණාකරනය</u> | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමණාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේඅංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රෙල්ඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක2020/14 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිතභාණ්ඩ අපහරණය කිරිම ප.මු.රී 490 අනුව සිදු කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **9** | <u>වාහන කළමනාකරණය</u> | | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල නොවේ | ඉන්දන පරීක්ෂාවන් සිදු කිරිමට කටයුතු කරනු ඇත. . | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාල නොවේ | - | - |
| | | | | |
| **10** | **<u>බැංකු ගිණුම් කළමණාකරනය</u>** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **11** | **<u>ප්‍රතිපාදන උපයෝජනය</u>** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | - | - |
| 11.2 | ප.මු.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම්වලට එලඹීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **12** | **<u>රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්</u>** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම. | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටිණයශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | මෙම අමාත්‍යාංශයේ සිට අනුරාධපුර කළාප අධ්‍යාපන කාර්යාලය වෙත 2008.04.10 දින ස්ථාන මාරු වී ගිය K.A.N. කුලසිංහ මහතාගේ රු 104,665.50 ක ණය ශේෂය ගිණුම් සාරාංශ මගින් පියවීමට කළාප කාර්යාලයට දැන් වුවද, 2013 වර්ෂයේ සිට මේ දක්වා ශේෂ නිරවුල් කිරිමට අදාල ලේඛණ කළාප කාර්යාලය සතුව නොමැති වීම හේතුවෙන් මු.රේ. 109 යටතේ ණය කපා හැරීමට ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇත. | - |
| | | | | |
| **13** | **<u>පොදු තැන්පත් ගිණුම</u>** | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම. | අනුකූල වේ | - | - |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **14** | **<u>අග්‍රිම ගිණුම</u>** | | | |
| 14.1 | ප.මු.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.2 | ප.මු.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාරයය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.3 | ප.මු.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **15** | **<u>ආදායම් ගිණුම</u>** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අදාල නොවේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්ථාවේම සෘජුවම ආදායමට බැර කර තිබීම. | අදාල නොවේ | - | - |
| 15.3 | ප.මු.රී. 116 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාල නොවේ | - | - |
| | | | | |
| **16** | **මානව සම්පත් කළමණාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම. | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| | | | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I)දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| **19** | **<u>මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.</u>** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම . | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | අමාත්‍යාංශය තුළ සහකාර ලේකම් (පාලන) නිළධරයෙකු නොමැති වීම නිසා චක්‍රලේඛය ප්‍රකාරව වගකීම් පවරා මෙම පත් කිරිම සිදු කර නොමැත. | - |
| | | | | |
| **20** | **<u>විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.</u>** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | - | - |

ජේ.එම්.ආර්.පී. ජයසිංහ.
ලේකම් ,
කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා
සත්ව සෞඛ්‍ය,සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

සකස් කළේ,

අත්සන : …………………….

නම : වයි.එම්.සි.පී. සිරිවර්ධන

තනතුර : සංවර්ධන නිළධාරි

අධීක්ෂණය,

අත්සන : …………………….

නම : ඒ.යූ.ජී.ටී. නන්දසිරි

තනතුර : සහකාර ලේකම් (මුදල්)

අනුමත කරමි,

අත්සන : …………………….

නම : ජේ.එම්.ආර්.පී. ජයසිංහ

තනතුර : ලේකම්, කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය, උතුරු මැද පළාත.